මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
Press Release

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

අංකය / எண் / No. CEB/2024/MR/014

දිනය / திகதி / Date 2024 නොවැම්බර් 26

සියලුම විද්‍යුත්, මුද්‍රිත වෙබ් පදනම් කරගත් මාධ්‍ය ආයතන,
ප්‍රධාන සංස්කාරක / ප්‍රවෘත්ති සංස්කාරක
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමණාකරු, වෙබ් සංස්කාරක,

හිතවත් මහත්මයාණෙනි/ මහත්මියණි,

## විදුලි ගාස්තු සංශෝධනය පිළිබඳ පැහැදිලි කිරීම

විදුලි ගාස්තු සංශෝධනය පිළිබඳව පළවන සාවද්‍ය ප්‍රකාශ ලංවිම තරයේ ප්‍රතික්ශේප කරයි.

පැවති ක්‍රමවේදයට අනුකූලව, 2024 අවසන් කාර්තුවේ පුරෝකතනය කළ වියදම්ද, දෙවන හා තුන්වන කාර්තුවල ආදායම් ද, 2014 - 2022 වකවානුවේ ගත් ණය යළි ගෙවීම් ද සළකා, 6% සිට 11% දක්වා පරාසය තුළ විදුලි ගාස්තු අඩු කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය 2024.10.24 දින ඉදිරිපත් කළ යෝජනාව විදුලිබල ක්ෂේත්‍ර නියාමක විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

2024 අවසන් කාර්තුව සඳහා නොව 2025 මුල් මාස 6 සළකා 2025.01.01 සිට බලපැවැත්වෙන පරිදි ගාස්තු සංශෝධනය සඳහා එම යෝජනාව යළි සකසා එවන ලෙස නියාමක විසින් ඉල්ලා සිටින ලදි.

2025 සඳහා එම නව යෝජනාව ක්‍රමවත් පරිදි ඉදිරිපත් කිරීම සඳහා ලංවිමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වන අතර, එම යෝජනාව 2024.12.06 දිනට පෙර නියාමක වෙත යොමු කෙරෙනු ඇත.

2024 මුල් කාර්තු 3 දී පැවති ක්‍රමවේදය වෙනස් කිරීමට නියාමක නිලධාරින් ගත් තීරණය නිසා, 2024 අවසන් කාර්තුවේදී මිල අඩුකිරිමට ලංවිමට අවසර ලැබුණේ නැත.

2014 -2022 කාලයේදී ණය ගැනීමට සිදුවුයේ, ලංවිම වියදම් අනුමත කළද, ඊට ගැලපෙන පරිදි විදුලි ගාස්තු සංශෝධනයට නියාමක නිලධාරින් කටයුතු නොකළ නිසාය.

ලංවිම කාර්යය වන්නේ විදුලි වියදම් ඇස්තමේන්තු කිරීම හා ගාස්තු සංශෝධන ඉදිරිපත් කිරීම වන අතර, ප්‍රමාණවත් කාලයක් ලබාගැනීම සිදු කරනුයේ පාරිභෝගිකයන් වෙත වඩාත් සාධාරණ ගාස්තු සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කිරීම වෙනුවෙනි.

මෙයට විශ්වාසී,
**ලංකා විදුලිබල මණ්ඩලය**

ඉංජිනේරු. A.D.K. පරාක්‍රමසිංහ
මාධ්‍ය ප්‍රකාශක

මාධ්‍ය අංශය, ලංකා විදුලිබල මණ්ඩලය,
නො. 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 00200, ශ්‍රී ලංකාව
e : media@ceb.lk